# බටහිර නුතනත්වයට ප්‍රංශයේ දායකත්වය

ලෝකයේ ඇත්තේ එකම මිනිස් පවුලක් යැයි මෑත දොඩවන ඇංකරයෝ එක් එක් රටවල විවිධ සංස්කෘතීන් ඇත්තේ කෙසේ දැයි පැහැදිලි නොකරති. ඒ ඒ සංස්කෘතීන් විසින් විවිධ දැනුම් පද්ධතීන් බිහිකරනු ලැබුයේත් ඒ දැනුම් පද්ධතීන් එකිනෙකට පටහැණිවන්නේත් කෙසේ ද යන්න ද ඔවුන්ට පැහැදිලි කර දිය නො හැකි ය. මගේ ලෝකය කෘතියෙහි කියැවෙන එක් කරුණක් නම් විවිධ දැනුම් පද්ධතීන් ඇති බවත් ඒ දැනුම් පද්ධතීන් බිහි වී ඇත්තේ විවිධ චින්තන මත පදනම් ව බවත් ය. පසුගිය දිනෙක මගේ ලෝකය කෘතියට වසර විස්සක් පිරීම නිමිත්තෙන් පවත්වන ලද සම්මන්ත්‍රණයකට සහභාගි වී තම අදහස් ප්‍රකාශකරන ලෙස එහි සඳහන් කරුණුවලට විරුද්ධව, ඇතැම් විට වක්‍රව, ලියන කියන කිහිප දෙනකුට ආරාධනාකර තිබුණි.ඔවුන් අතර විද්‍යුසර පුවත්පතට ලිපි සපයන්නෝ ද වූහ. එහෙත් ආරාධනයකෙරුණු සියල්ලන්ගෙන් එයට සහභාගි වීමට තරම් සුළු හෝ ශක්තියක් තිබුණේ මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතාට පමණ ය. ඔහු ද කෘතියෙහි අඩංගු කරුණු පිළිබඳ ව කතානොකිරීමට වග බලාගත්තේ ය. බියගුළු පුස්සන් ගැන කීමට දෙයක් නැත. ඔවුහු ස්වරූපයෙන් මිනිස්සු වෙති. එහෙත් ඔවුන්ට පිට කොන්දක් වේද යන්න ප්‍රශ්නයකි. මේ පුස්සන්ට අවශ්‍ය නම් ඔවුන්ගේ ම ගම්පළාත්වල ඒ සම්මන්ත්‍රණ සංවිධානය කළහැකි ය. මා ඇඟිලි ගනිමින් බලා සිටින්නේ බලංගොඩ හා අවට ප්‍රදේශවල බටහිර විද්‍යාවේ බොරුව ගැන කතාකිරීමට ය.

ඒ කෙසේ වෙතත් අපි නැවතත් එංගලන්තයේ ඉංගිරිසි සංස්කෘතියෙහි එක් යුගයක ඇති වූ වික්ටෝරියා සදාචාරය යන නමින් වූ ප්‍රපංචයට ආපසු යමු. වික්ටෝරියා සදාචාරය හඳුනාගැනීමට චින්තනය යන සංකල්පයෙන් විශාල රුකුලක් ලැබෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇතිවීමේ දී බල පෑ වෙනත් සාධක අතර සමාජයීය පෞද්ගලිකත්වය ඉස්මතුවීම ගැන ද අපි කතාකෙළෙමු. පෞද්ගලිකත්වය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ප්‍රධාන ලක්‍ෂණයක් විය. සමාජයීය සාමූහිකත්වය නැති වී යෑමත් සමග ඇති වූ පෞද්ගලිකත්වය විසින් මිනිසා අනෙකුත් මිනිසුන්ගෙන් මෙන් ම භූමියෙන් ද වෙන්කරනු ලැබිණි. වෙන්කිරීම ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි අංගයක් වෙයි.

ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත බිහි වූ ධනපති ක්‍රමය එංගලන්තයෙහි මුලින් ම ඇති වූ නමුත් මුල දී ඒ ක්‍රමයට එයටම ආවේණික වූ සදාචාර සංග්‍රහයක් නිල වශයෙන් ගොඩනගා ගැනීමට නො හැකි විය. එබැවින් කතෝලික චින්තනයෙහි සදාචාරය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ද සදාචාරය බවට අඩුම තරමින් මතුපිටින් හෝ පත්විණි. එංගලන්තයට පසුව ධනපති ක්‍රමයට පිවිසි ප්‍රංශය එහි ආගම ලෙස කතෝලික ආගම අත්නොහැරිය ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානියට හිමි සදාචාර සංග්‍රහය නිර්මාණයකිරීමේ මුල් පියවර ගත්තේ ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි කලා මධ්‍යස්ථානය බවට පත්වූයේ ද ප්‍රංශයෙහි පැරීසිය ය.

ඉතාලියෙහි පිරෙන්ට්සි හෙවත් ඉංගිරිසි උච්චාරණයට අනුව ෆ්ලොරන්ස් නගරය කතෝලික සංස්කෘතියෙහි කලා මධ්‍යස්ථානය වූ පරිද්දෙන් පැරිසිය යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි කලා මධ්‍යස්ථානය බවට පත්විණි. කලාවෙහි පෞද්ගලිකත්වය, කලාකරුවාගේ ඊනියා නිදහස ආදී සංකල්ප මෙන් ම විවාහයෙහි ලිහිල් බව පිළිබඳ අදහස් ද ප්‍රංශයෙන් ක්‍රම ක්‍රමයෙන් ඉදිරිපත්කෙරිණි. පුද්ගලයාගේ නිදහස වැඩිවීම හේතුවෙන් ඒ ඒ තැනැත්තා විවාහය නමැති සංස්ථාවට තිබූ බැඳීම ද අඩුවිය. ආගමින් කතෝලික වුව ද ප්‍රංශය සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානි විය. ඒ අද මෙරට ඇතැමුන් ආගමින් බෞද්ධ වී සංස්කෘතියෙන් යුදෙව් ක්‍රිස්තියානි වන්නාක් මෙනි.

කෙසේ හෝ ප්‍රංශයෙන් විවාහය, ලිංගිකත්වය ආදිය ගැන මෙන් ම කලාව ගැන ද බිහි වූ අදහස් එංගලන්තයට ද පැතිරගියේ ය. කලින් කියා ඇති පරිදි එංගලන්තය කතෝලික සංස්කෘතියෙහි සදාචාර සංග්‍රහයෙහි ම සිර වී සිටියේ ය. උඩින් එසේ වුව ද සමාජ අභ්‍යන්තරයෙහි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට හිමි අදහස් පැතිර ගියේ ඒ නිසා දෙබඩිබවක් හා කුහකත්වයක් සමාජයෙහි ඇතිකරමිනි. මේ කුහකත්වය නැතිකිරීමෙහි මුල් පියවර ගැණුනේ සාහිත්‍යකරුවන් විසින් යැයි කිවහැකි ය. මෙහි දී ඩී. එච්. ලෝරන්ස්, ඔස්කාර් වයිල්ඩ් ආදී සාහිත්‍යකරුවෝ කැපී පෙනෙති. ඔවුහු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි සාහිත්‍යකරුවෝ වූහ.

© Prof. Nalin De Silva

එංගලන්තයට ද ක්‍රමයෙන් සමාජ අභ්‍යන්තරයෙහි තිබූ සදාචාර සංග්‍රහය නිල වශයෙන් පිළිගන්නවා හැරෙන්නට කළහැකි අන් කිසිවක් නො වී ය. වෙනත් වචනවලින් කිවහොත් කුහකත්වය අත්හැර සමාජයේ මතුපිටින් පිළිගෙන තිබූ වික්ටෝරියානු සදාචාරය වෙනුවට සමාජයේ අභ්‍යන්තරයෙහි සැඟවී ක්‍රියාත්මක වූ සදාචාර සංග්‍රහය මතුපිටට ගෙන ඒමට බලකෙරිණි. විසිවැනි සියවසෙහි දශක කිහිපයකට පසු මේ පෙරළිය ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක වීමට පටන්ගැණිනි. එය තවමත් කෙළවර වී නැත. දැන් සමාජයේ මතුපිට පමණක් පිළිගැනෙන සදාචාරයක් නොමැති වුවත් මතුපිට හා ඇතුළත තිබෙන සදාචාරය දිනෙන් දින මෙන් වෙනස් වෙයි. එහි ඇතැමුන් කියන්නාක් මෙන් ඊනියා පශ්චාත්නූතනත්වයක් නැත. එහි ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ම තව තවත් වර්ධනය වීමේ ප්‍රවණතාවක් පමණකි.

අප කලින් කියා ඇති පරිදි ඒ තව තවත් වර්ධනය වී අවසානයේ දී පවුල වෙනුවට මිනිසා පමණක්, එනම් පුද්ගලයකු පමණක් ඇතිවීමත්, ඉනුදු ඔබ්බට ගොස් පුද්ගලයා ද සමාජයීය වශයෙන් භින්නෝන්මාදයෙන් පෙළෙන්නකු බවට පත්වීමත් සිදුවනු ඇත. අනෙක් පුද්ගලයන්ගෙන් වෙන්වුණු පුද්ගලයාට තමන්ගෙන් ද වෙන්වීම හැර කළහැකි වෙනත් දෙයක් නැතිවනු ඇත. වික්ටෝරියානු සදාචාරය යනුවෙන් ක්‍රියාත්මක වූ සංග්‍රහය අද බටහිර රටවල් සම්බන්ධයෙන් ගත්කල එංගලන්තයේ ද නැත. ඒ වෙනුවට එහි ඇත්තේ සමාජයීය වශයෙන්, හුදෙක් මානසික වශයෙන් නොව, භින්නෝන්මාදී පුද්ගලයන් බිහිකරන දිශාවකට යොමුකරන සදාචාර සංග්‍රහයක් සහිත සමාජ පද්ධතියකි.

ලංකාවේ අපට මේ ක්‍රියාදාමය අදාළවන්නේ කෙසේ ද? අද ඇතැම් පඬුවන් මෙරට ඇති වික්ටෝරියානු සදාචාරයක් ගැන කතාකරනු දැකිය හැකි ය. ඔවුන්ට අනුව මෙරට ඈත අතීතයේ තිබූ සදාචාර සංග්‍රහය වෙනුවට දැන් ඇත්තේ ඉංගිරිසින්ගෙන් අපට ලැබුණු කුහක සදාචාරයකි. අද මෙරට පවතින විවාහ හා දික්කසාද ක්‍රම ඔවුහු විවේචනය කරති. එහෙත් මේ එක් අයකුට හෝ නිශ්චිතව මෙන්න මේ කරුණ වික්ටෝරියානු සදාචාරය යැයි  කීමට හැකියාවක් නැත. ඔවුහු දුවන්නන් වාලේ ගොස් වික්ටෝරියානු කුහක සදාචාරයක් ගැන කියති.

අද පවත්නේ යැයි කියන වික්ටෝරියානු සදාචාරය ගැන කීමේ දී ඔවුහු ඇතැම් විටක රොබට් නොක්ස් සඳහන්කරන ලිහිල් විවාහ ක්‍රමය ගැන ද මතක්කරති. එයින් ඔවුන් අදහස්කරන්නේ මෙකල ද ඕනෑම අයකුට පහසුවෙන් දික්කසාද වීමට ඉඩ දීම ද, එසේත් නැත්නම් ඕනෑම අයකුට එසේ විවාහය අවලංගුකර නැවත විවාහවීමට ඉඩකඩ සැපයීම ද, එසේත් නැත්නම් විවාහක පුරුෂයා හෝ ස්ත්‍රිය හෝ සිටිය දී වෙනත් පුරුෂයකු හෝ ස්ත්‍රියක හෝ සමග අනියම් සම්බන්ධකම් පැවැත්වීමට ඉඩකඩ ලබාදීම ද ආදී කිසිවක් පැහැදිලි නැත.

මේ පඬිවරු පුදුමාකාර අය වෙති. ඔවුන් මේ අපැහැදිලිව වුවත් කියන්නේ අද මෙරට සදාචාරය වික්ටෝරියානු සමයෙහි ඉංගිරිසින්ගෙන් ලබාගත් එකක් බවත් අප එසේ ඉංගිරිසින්ගෙන් ලැබුණු දෙයක් යොදාගැනීම අනුචිත බවත් අප පැරණි සදාචාරය වෙත යා යුතු බවත් ය. එහෙත් ඔවුන් නොකියා කියන්නේ අප අද දිනයේත් දැනට පවත්නා බටහිර සදාචාරය ම අනුගමනයකළ යුතු බව ය. අනුකාරකයන් වූ මේ පඬුවන් ඊනියා වික්ටෝරියානු සදාචාරයකට විරුද්ධවන්නේ අද බටහිර වික්ටෝරියානු සදාචාරය නැති බැවින් ය යන්න නම් සක්සුදක් සේ පැහැදිලි ය. යම්කිසි අයුරකින් අද ද බටහිර වික්ටෝරියානු සදාචාරය පැවතියේ නම් මේ ඊනියා ප්‍රබුද්ධයන් එයට කිසිසේත් ම විරුද්ධ නොවනු ඇත.

අද මෙරට විවාහ සංස්ථාව අර්බුදයකට යමින් පවතින බව සැබෑ ය. විවාහය පැත්තකින් තිබිය දී අනියම් සම්බන්ධකම් පවත්වන්නවුන්ගේ සංඛ්‍යාව ඉහළ යමින් පවතී. තම නිල බලය යොදාගනිමින් ස්ත්‍රීන්ට අනියම් බලපෑම්කරන්නන් දැකගත හැක්කේ දේශපාලනඥයන් අතර පමණක් නො වෙයි. ස්ත්‍රීන් තම නිවසින් හෝ ගෘහස්ථ පරිසරයෙන් බාහිර ව රැකියා සඳහා යෑමට සිදුවීම ද ප්‍රශ්නයට එක් හේතුවකි. ඒ අතර මැද පෙරදිග රැකියා සඳහා ගොස් ඇති ඇතැම් කතුන්ගේ පෞද්ගලික ජීවිත ද පවුල් ජීවිත ද අවුල් වී ඇති බව ද පැහැදිලි ය.

එහෙත් මේ ප්‍රශ්න ඇතිවී තිබෙන්නේ අප ඊනියා වික්ටෝරියානු කුහක සුචරිතයක් අනුගමනයකරන නිසා ද? පඬිවරුන් වික්ටෝරියානු සුචරිතය මේ රටට බලපා ඇත්තේ කෙසේ දැයි නිශ්චිත ව නොකියන බැවින් මෙහි දී තරමක ගැටළුවකට මුහුණ පෑමට ද සිදුවෙයි. ඒ එසේ වුවත් අපි ඓතිහාසික වශයෙන් මෙරට සුචරිත සංග්‍රහය විකාශය වී

ඇති ආකාරය විශ්ලේෂණය කරමු. එහි දී බටහිර බලපෑම් ඇති වී ඇත්තේ කෙසේ ද යන්න ද සැලකිල්ලට භාජනය වියයුතු අතර මෙරට සමාජයේ කුහකත්වයක් ඇත්නම් එයට හේතුව සිංහල බෞද්ධ සංස්කෘතිය ද යන්න ද සොයා බැලිය යුතුවන්නේ ඊනියා ප්‍රබුද්ධයන් ඕනෑම කරුණක දී ගෙදර තිබෙන සිංහල බෞද්ධ මුවහමට තඩිබෑමට නොබියව ඉදිරිපත් වීම ද නිසා ය.

අප මේ සියල්ල සාකච්ඡාකරන්නේ නවකතා, කෙටිකතා හා ජාතක කතා අතර සම්බන්ධය ගැන කතාකරන අතර බව අමතක නොකළ යුතු ය. අප රටට වික්ටෝරියානු සදාචාරය බලපෑ අන්දම ගැන යම් විග්‍රහයකින් පසුව අප නැවතත් නවකතා හා අනෙක් සාහිත්‍යාංගවලට යා යුතු ය. එසේ ම මේ සියල්ලට ම පසුබිමෙහි ඇත්තේ බටහිර විද්‍යාවෙහි හා සාධාරණ වශයෙන් ගත්කල බටහිර දැනුම් පද්ධතියෙහි ආක්‍රමණයත් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි ප්‍රතිඵලයක් ලෙස එය අප මත බලෙන් පැටවීමත් බව ද සිහි තබාගත යුතු ය.

අපට බටහිර බලපෑම් ඇතිවුයේ පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසුව ය. මෙරට සදාචාරය පිරිහීම ඇරඹුණේ ද ඉන්පසුව ය. අද අප රටේ ඇති දූෂණ, හොරමැරකම්, මිනීමැරුම්, අනියම් සම්බන්ධකම්, බේබදුකම් ආදී සියල්ල බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵල ය. ඒ සියල්ල සිංහල බෞද්ධ සංස්කෘතිය නිසා සිදු වූ දෑ නොව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය නිසා ඇති වූ දෑ ය. සිංහල බෞද්ධ සංස්කෘතිය එයට වගකිවයුතු නම් එසේ වන්නේ එකම එක කරුණක් හේතුකොටගෙන ය. ඒ මිනිසුන් සිංහල බෞද්ධ සංස්කෘතියට බැඳ තබන මනු නීතියක් වැන්නක් ඒ සංස්කෘතියෙහි නොමැති වීම නිසා ය. හින්දු සංස්කෘතියට හෝ මුස්ලිම් සංස්කෘතියට හෝ වෙනත් ඒකදේවවාදී නිර්මාණවාදී ආගමක් මත පදනම් වූ සංස්කෘතියක දක්නට ඇති මිනිසුන් ඒ ඒ සංස්කෘතියට බැඳතබන නීතියක් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි නොමැතිවීමත් එහි මිනිසුන්ට ඇති නිදහසත් හේතුවෙන් සිංහලයන්ට වෙනත් සංස්කෘතියකට ඇතුල්වීමට තිබූ ඉඩකඩ අධික විය. මිනිසුන්ගේ ඉන්ද්‍රිය පිනවීම මුල්තැනක ලා සලකන බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඉදිරියෙහි ඔවුන් තම මුල් සංස්කෘතීන්හි රඳවාගත හැක්කේ දැඩි නීති සංග්‍රහයක් යටතේ ය. සිංහලයන්ට එවැනි නීති සංග්‍රහයක් නො වී ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva